(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 65]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 ජනවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0653/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0720/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) භාණ්ඩාගාරය විසින් සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගමට (හිල්ටන් හෝටලයට) ලබා දී ඇති ණය ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් ණය මුදල සම්බන්ධයෙන් වන භාණ්ඩාගාර ලේඛන සභාගත කරමින්,

(i) ණය මුදලේ ප්‍රමාණය හා එය ලබාදුන් දිනය කවරේද;

(ii) පොලී අනුපාතයන් හා නැවත ගෙවීමේ කොන්දේසි කවරේද;

(iii) ප්‍රාග්ධනය නැවත ගෙවීමේ කොන්දේසි කවරේද ;

(iv) අද දින වන විට උපචිත පොලී ප්‍රමාණය කොපමණද;

(v) අද දින වන විට ගෙවීමට ඇති මුළු පොලී ප්‍රමාණය හා ගෙවීමට ඇති මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කර ඇති ණය මුදල්වල ගෙවීම පැහැර හරින ලද ණය මුදල්ද ඇතුළත්වී තිබේද;

(ii) 2008 වර්ෂය තුළ ලබා දෙන ලද ණය මුදල්වල ප්‍රමාණය, ඒවා ලබා දුන් දිනය හා ඒවායේ කොන්දේසි කවරේද;

(iii) භාණ්ඩාගාරය විසින් උක්ත ණය මුදල් හා පොලිය අයකර ගනු ලබන්නේ කෙසේද;

(iv) හෝටලය ඉදිකිරීමේ මූලික සැලසුම් පිරිවැය හා තථ්‍ය පිරිවැය කොපමණද;

(v) අද වන විට හෝටලයේ ශුද්ධ වටිනාකම කොපමණද; සහ

(vi) හෝටලයට අයත් මුළු භූමි ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0721/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2008 වසරට අදාළ අයවැය සම්මත වීමෙන් පසුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව, වැය ශීර්ෂ 801 සහ 240 යටතේ සිදුකරන ලද සියලු වියදම් එතුමා මෙම සභාවට වෙන්වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මෙම වියදම් පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දුන් දිනය සහ දැනුම් දුන් ආකාරය කවරේද;

(ii) සමුච්චිත වශයෙන් රු. මිලියන 150 ඉක්මවා ගොස් ඇති, ඉහත (අ) අනුව සිදුකරන ලද සියලු වියදම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0735/'08

4.

ගරු ජේමසිරි මානගේ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) ශ්‍රී ලංකාවේ තේක්ක වන වගාව පැතිර ඇති හෙක්ටයාර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවලද;

(iii) පසුගිය දස වසර තුළ, මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල තේක්ක වන වගාවේ තේක්ක ගස් අලෙවියෙන් ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළ කටයුතු කළ අදාළ විෂයභාර අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0862/'08

5.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) ලංකාවේ උතුරු මුහුදු කලාපයේ අප රටට අයත් මුහුදු සීමාව වෙරළේ සිට කොපමණ දුරකින් පිහිටා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරේ මුහුදු සීමාව සම්බන්ධයෙන් ''සාර්ක්'' සමුළුවේ දී කවර හෝ තීරණයක් ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ගනු ලැබූ තීරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉන්දීය ධීවරයින් ලංකාවට අයත් මුහුදු සීමාවේ මසුන් මැරීම සම්බන්ධයෙන් මේ වනවිට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0918/'08

6\. ගරු ජේමසිරි මානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) කැලණි ගුවන් පාලමේ දිග හා පළල කොපමණද;

(ii) මාතර - වැල්ලවාය මාර්ගයේ දිග හා පළල කොපමණද;

(iii) කැලණි ගුවන් පාලමට වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(iv) ඒ සඳහා මුදල් සැපයූ රජයේ හෝ ආයතනයේ නම කවරේද;

(v) ඊට අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර - වැල්ලවාය මාර්ගයට වෙන්කර තිබෙන මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවූයේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

(iv) ටෙන්ඩර් ඉදිරිපත් කළ පාර්ශ්වයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) ඉදිකිරීම් කටයුතු සිදුකළ සමාගමේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0885/'08

7\. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට ,—(1)

(අ) (i) පිළියන්දල නාම්පමුණුවේ ඉදි කරන ලද ඩයලොග් සන්නිවේදන කුලුන පිහිටා ඇත්තේ ජනාවාස බහුල ප්‍රදේශයක බවත්;

(ii) 2008.06.29 දින හෝ ආසන්න දිනයක රාත්‍රියේ අකුණු සැර වැදීම නිසා කුලුන ආසන්න ප්‍රදේශයේ නිවාසවල විද්‍යුත් පරිපථ, ගෘහ විදුලි උපකරණ හා දුරකථනවලට දැඩි අලාභහානි සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ඩයලොග් ආයතනය ඇතුළු වගකිවයුතු ආයතන වෙත මෙම සිද්ධිය පිළිබඳව ප්‍රදේශවාසීන්ගේ අත්සනින් යුත් පෙත්සම් යොමුකර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම දුරකථන සන්නිවේදන කුලුන ඉදිකිරීම සඳහා අනුමතිය ලබාදීමේදී සලකා බලන ලද කරුණු කවරේද;

(ii) ඒ සඳහා අනුමතිය ලබාගත යුතු ආයතන කවරේද;

(iii) අදාල දුරකථන කුලුන ඉදිකිරීමට එකී ආයතන මගින් අනුමතිය ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එම නිවාසවල උපකරණවලට සිදුවී ඇති අලාභහානි වෙනුවෙන් වන්දි මුදල් ගෙවීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0893/'08

8.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බොල්ගොඩ ගඟේ ගඟ රක්ෂිතය අයත් වන්නාවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) ගඟ රක්ෂිතයට අදාළ මැණුම් සිතියම් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මැණුම් සිතියම්වල දක්වා ඇති ගඟ රක්ෂිත ප්‍රදේශ බොහොමයක් පෞද්ගලික අයිතියට ගෙන ඇති බවත්;

(ii) ඒවායේ ගොඩනැගිලිද ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) බොල්ගොඩ ගඟ හා ගඟ රක්ෂිතයේ ඉතිරිව ඇති ස්ථාන ආරක්ෂා කර ගැනීමට ගන්නා පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0897/'08

9.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාත් සභා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන සහ තනතුර, අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්ට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උතුරු මැද හා සබරගමුව, පළාත් සභා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය එම නිලධාරීන් සේවය කරන ආයතන, තනතුර සහ දිස්ත්‍රික්කය ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ අනුව නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණවලදී ඡන්ද මධ්‍යස්ථාන මට්ටමින් සහ ශාලා අංක අනුව ගණන් කිරීමේ ප්‍රධාන නිලධාරී ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ නාම ලේඛනය, ලිපිනයන් සහ සේවා ස්ථානයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණ දිනයන්හිදී ක්‍රියාත්මක වූ පරිගණක කාර්යාලයේ නිලධාරීන්ගේ නම, තනතුර සහ ආයතනයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0905/'08

10.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) මීගමුව - කුරුණෑගල මාර්ගයේ සහ පන්නල - කුලියාපිටිය මාර්ගයේ පස්වරු 7.00 න් පසුව පෞද්ගලික බස්රථ හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ ධාවනය නොවන බවත්;

(ii) රැකීරක්ෂා සඳහා ගොස් පස්වරු 7.00 න් පසු ආපසු නිවෙස් වෙත පැමිණෙන විශාල පිරිසක් මේ හේතුවෙන් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මීගමුව - කුරුණෑගල මාර්ගයේ සහ පන්නල - කුලියාපිටිය මාර්ගයේ පස්වරු 7.00 සිට පස්වරු 11.00 දක්වා බස්රථ ධාවනය කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0898/'08

11.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව විසින් බුලත්කොහුපිටිය, වැගල්ල, උඩහවත්ත පදිංචි එච්. පී. දයානන්ද මහතාට අයත් අක්කර 4 ක පමණ ඉඩම මිලදී ගෙන තිබේද;

(ii) එසේ නම්, එම මිලදී ගැනීමට අදාළව ඉඩම් අත්පත් කරගැනීමේ නෛතික පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) ඉඩමේ වටිනාකම තක්සේරු කරන ලද්දේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් පී. සී. ඩී. සිගේරා මහතා විසින් මෙම ඉඩමේ ඇති ගස් ඉවත්කර ගැනීම සඳහා දයානන්ද මහතාට අංක /බුල/5/6/43 යටතේ බලපත්‍රයක් නිකුත්කර තිබෙන බවත්;

(ii) අදාළ ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ බලපෑම යටතේ පොලිස් නිලධාරීන් විසින් එම ගස්කැපීම නතර කර ඇති බවත්;

(iii) මෙම ගැටලුව පිළිබඳව පළාත් ප්‍රධාන අමාත්‍යතුමාට, පළාත් පාලන කොමසාරිස්වරයාට, අතිගරු ජනාධිපතිතුමාට, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාට සහ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට ලිඛිතව පැමිණිලි කළද සාධාරණ විසඳුමක් නොලද බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම ඉඩම මිලදී ගැනීමේදී ඇතිවූ එකඟතාවය අනුව විකුණුම්කාර දයානන්ද මහතාට ඉඩමේ ගස් ඉවත්කර ගැනීමට හෝ ඔහුට සිදුවූ අසාධාරණයට විසඳුමක් හෝ ලබාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0904/'08

12.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල අධ්‍යාපන කලාපයට අයත් දැනට ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා එක් එක් අධ්‍යාපන කොට්ඨාස අනුව නම් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් පාසලට අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පාසලේ දැනට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ වසා දමා ඇති පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් කොපමණද;

(ii) එම පාසල් වසා දමන ලද්දේ කවර වර්ෂයේද;

(iii) අදාළ පාසල් වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත වූ පාසල් වසා දැමීමේ අනතුරින් වළක්වා ගැනීමට අවශ්‍ය භෞතික සම්පත්, මානව සම්පත් හා අනෙකුත් පහසුකම් ලබාදීමට සහ පාසල් වසා දැමීම වැළැක්වීමට අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0913/'08

13.

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) මාතලේ සංස්කෘතික මධ්‍යස්ථානය හා එම භූමිය මාතලේ ප්‍රාදේශීය ලේකම් විසින් සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට විධිමත්ව පවරා තිබේද;

(ii) එලෙස පවරා දී තිබේ නම්, එම ඉඩමේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් දෙවන අදියර වශයෙන් ශාලාව ඉදිකිරීමට අදාළ වාස්තු විද්‍යාත්මක සැලැස්ම හා ඇස්තමේන්තුව සකස් කළ බවත්;

(ii) සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2006 වර්ෂයේදී ඒ සඳහා මුල්ගල තැබූ බවත්;

(iii) මේ වනතෙක් එය මුල්ගලට පමණක් සීමාවී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ශාලාව ඉදිකිරීමට ඇති බාධා කවරේද;

(ii) එම බාධා ඉවත්කර ශාලාව ඉදිකිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0925/'08

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 ජනවාරි මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 168/2) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාල සීමාවේ එක් එක් දිනයේ දී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුරු හෝ සේවා ස්ථාන කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0981/'08

15.

ගරු ජිනදාස කිතුලගොඩ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන පෙළ පොත් මුද්‍රණයේ දී පසුගිය වසරකට අදාළව අතිරික්ත පොත් ප්‍රමාණයක් මුද්‍රණය කර තිබේද;

(ii) එම පොත් ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

(iii) සැලසුමකින් තොරව මෙතරම් විශාල පොත් ප්‍රමාණයක් මුද්‍රණය කිරීමේ හේතුවෙන් රජයට අතිවිශාල පාඩුවක් ගෙන දුන් නිලධාරීන් කවුරුන්ද;

(iv) එකී නිලධාරීන්ට එරෙහිව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත පොත් තොගය සම්බන්ධව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*2.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*3.

රණවිරු සේවා අධිකාරි (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*4.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*6.

පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*7.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*8.

සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*13.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*16.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*17.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*18.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*19.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.)[1]

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*25.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*26.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

27.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

28.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— සලකා බැලීම.

33.
බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.
රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0654/'08

1.
ගරු රවි කරුණානායක මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0656/'08

2.
ගරු රවි කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව සඳහා එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0657/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0658/'08

4.

ගරු රවි කරුණානායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) ඉහත කාල සීමාව සඳහා එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0659/'08

5.

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) ඉහත කාල සීමාව සඳහා එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0660/'08

6\.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය මගින් හෝ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0661/'08

7\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) ඉහත කාල සීමාව සඳහා එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0662/'08

8\.

ගරු රවි කරුණානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) ඉහත කාල සීමාව සඳහා එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0663/'08

9.

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4 ක කාලය තුළ, අමාත්‍යාංශය මගින් හෝ අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් මගින් කුලියට ලබාගන්නා ලද එක් එක් වාහනය සඳහා වූ මුළු පිරිවැය හා කුලියට හෝ බද්දට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වූ මුළු පිරිවැය කොපමණ ද යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව සඳහා—

(i) ඉහත කාල සීමාව සඳහා එකී වාහන භාවිතය වෙනුවෙන් ඉන්ධන සඳහා වැය වූ මුදල සහ එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ඉහත සඳහන් කුලියට ගත් කාර්යාල ඉඩකඩ සඳහා වර්ග අඩියකට පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) තැන්පතුවක් ලෙස ගෙවන ලද අත්තිකාරම් මුදල ද සමගින් ගොඩනැගිල්ල බද්දට ලබාගත් කාල සීමාව කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0926/'08

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2007 පෙබරවාරි මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 168/10) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාල සීමාවේ එක් එක් දිනයේ දී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0927/'08

11\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 මාර්තු මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 168/19) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාල සීමාවේ එක් එක් දිනයේදී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0928/'08

12\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 අප්‍රේල් මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 168/21) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාල සීමාවේ එක් එක් දිනයේ දී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0929/'08

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 මැයි මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 169/6) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාලසීමාවේ එක් එක් දිනයේ දී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0930/'08

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 ජුනි මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 169/15) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාල සීමාවේ එක් එක් දිනයේදී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?